# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

| | |
|---|---|
| ශ්‍රේණිය | : 7 ශ්‍රේණිය |
| වාරය | : තුන් වන වාරය |
| නිපුනතා මට්ටම | : 5:2 : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. |
| ක්‍රියාකාරකම | : 5:2 : ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම හඳුනා ගනිමු. |





සැකසුම: ටී. කේ. ජයසේකර
මහ/වත්/කෙන්ගල්ල ම.වි.
මෙහෙයවීම: නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස් :

*මෙය ලිඛිත පාඩමකි. මෙය වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුයි.*

## හැඳින්වීම

උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට අයත් ප්‍රචලිත ප්‍රදේශ, වාද්‍ය භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ කට්ටලය, මූලික අංගහාර, ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු 6 ශ්‍රේණියේ දී ඔබ ඉගෙනුම ලබා ඇත.

මෙම පාඩමෙන් බලාපොරොත්තු වන්නේ උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය වන කොහොඹා කංකාරි ශාන්තිකර්මය පිළිබඳ මූලික කරුණු අධ්‍යයනය කිරීමට ය.



# ශාන්තිකර්ම යනු

“ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්යය සංසිද්ධියකි”.

## දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ශාන්තිකර්ම

උඩරට නර්තන සම්ප්‍රදාය



කොහොඹා කංකාරි ශාන්තිකර්මය

පහතරට නර්තන සම්ප්‍රදාය



දෙවොල් මඩු ශාන්තිකර්මය

සබරගමු නර්තන සම්ප්‍රදාය



පහන් මඩු ශාන්තිකර්මය

# කොහොඹා කංකාරි ශාන්තිකර්මය

ශ්‍රී ලංකාවේ ඉපැරැණි චාරිත්‍ර පූජාවක් වන කොහොඹා කංකාරිය දෙවියන්ට පූජෝපහාර දැක්විමට පවත්වනු ලබන ශාන්තිකර්මයක් ලෙස සැලකේ.

මෙය,

- කොහොඹා යක් කංකාරිය
- කොහොඹා යකුම
- කොහොඹා යක්කම

යන නම් වලින් හදුන්වනු ලැබේ.

කංකාරිය ප්‍රචලිත ප්‍රදේශ

- සතර කෝරලය
- සත් කෝරලය
- මහනුවර

# වෙස් ඇඳුම් කට්ටලයේ කොටස්

- ජටාව
- වෙස් තට්ටුව
- තෝඩුපත්
- ජටා පටිය
- පාහීන්පත
- දෙවුර මාලය
- කර පටිය
- බුබුළු පටිය ...... ආදි වශයෙන්



# උඩරට කොහොඹා කංකාරි ශාන්තිකර්මය පැවැත්වීමට හේතු

**අතීතයේ පැවැත්වීමට හේතුව** → පඬුවස් දෙව් රජුට වැළඳුණු දිවිදොස් නිසා හටගත් රෝග සුව කිරීම

**වර්තමානයේ පැවැත්වීමට හේතුව**

- ධන, ධාන්‍ය, ගව, මහිෂාදී භව භෝග සම්පත් වැඩි දියුණු වීම
- පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම
- ගමකට, ප්‍රදේශයකට, මුළු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම.
- අධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යන හා පර්යේෂණ සඳහා)

පුද ලබන දෙවිවරු -

- අලුත් කොහොඹා
- මහ කොහොඹා
- පරණ කොහොඹා

# කොහොඹා කංකාරියේ කථා පුවත

විජය රජු කුවේණිය සරණ පාවා ගෙන වාසය කිරීමේ දී ඔහුට ජීවහත්ත සහ දිසාලා යන නම් දරු දෙදෙනා උපදිති. ඉක්බිති ඔහු කුවේණිය පලවා හැර මදුරාපුරයෙන් ගෙන්වා ගත් සම කුල කුමරියක සරණ පාවා ගනී. විජය රජු කෙරෙහි කෝපයට පත් කුවේණිය ඔහුට ශාප කළාය. විජය රජුගේ ඇවෑමෙන් රජ පැමිණි පඬුවස් දෙව් රජුට කුවේණිය විසින් විජය රජුට කරන ලද ශාපය වැදිණි.

සිහිනෙන් දිවි වෙසක් දැක බියපත් වූ පඬුවස් දෙව් රජු බලවත් සේ රෝගාතුර විය. කොහොඹා කංකාරියේ දිවි දෝෂය නමින් හැඳින්වෙන්නේ මෙය යි. මෙම දිවි දෝෂය දුරු කිරීම සඳහා නොයෙක් සෙත් ශාන්ති කරවන ලද නමුත් සුවයක් නො ලැබුණි. අනතුරුව ශක්‍ර දේවේන්ද්‍ර මෙය සැල කර සිටියේය. දිවියෙකු සිහිනෙන් දැක බිය වීමෙන් හටගත් රෝගයක් හෙයින් මවු කුසෙන් උපන් කෙනෙකුට දුරු කළ නොහැකි නිසා මලෙන් උපන් කෙනෙකු සොයා යාගය කරන ලෙස උපදෙස් දෙන ලදී.

මෙම කාර්යය රාහු අසුරේන්ද්‍රයාට භාර කරන ලදී. රාහු අසුරේන්ද්‍රයා විෂ්ණු දෙවියන්ගේ දස අවතාර වලින් එකක් වන දියෙන්, ගින්නෙන්, ආයුධවලින් හෝ හීයකින් හෝ නො නස්නා බල ඇති ඌරු අවතාරය ලබා දෙන්නේ නම් කායර්ය භාර ගන්නා බව කියා සිටියේය. අවසරය ලැබුණු රාහු අසුරේන්ද්‍රයා සත් මුහුදෙන් එතෙර වී, මලය රටට ගොස් රජුගේ නන්දන උයන විනාශ කරන්නට පටන් ගති. උයන ආරක්ෂා කරන උයන් පල්ලා සිදුව ඇති විපත මලය රජුට දැන්වීය. රජු ඌරා ඇල්ලීම සඳහා නුවර අණබෙර ලවා වැදි සේනාව රැස් කර උයන වට කළේය. ඌරා මලය රජුගේ නුවරට වැද මාළිගා බිඳ දුවන විට මලය රජු, කිත්සිරු, සඳලිඳු යන තුන්දෙන අතින් දුනු හී ගෙන ඌරා ලුහුබැඳ ලක්දිවට පැමිණියේය. සත් මුහුද පීනා ගිය ඌරා ලක්දිවට පැමිණ හන්තාන කන්ද අසල දී ගලක් බවට පත් විය. මලය රජු කඩුවෙන් කොටා විස්මයට පත් වූ අවස්ථාවේ එතැනට පැමිණි සක් දෙව් රජු මලය රජු ඇතුළු පිරිස මෙහි ගෙන්වීම පිණිස මෙවැනි මායාවක් කළ බවක් විස්තර කළේය. මලය රජු ඇතුළු පිරිස පඬුවස් දෙව් රජුගේ දිවි දොස් සුවපත් කිරීම පිණිස අනුරාධපුරයේ මහමෙව්නා උයනේ දිග පළල සහිත මණ්ඩපයක් කරවා ශාන්තිකර්මය සිදු කිරීමෙන් අනතුරුව දිවි දෝෂය සුවපත් විය.

# කොහොඹා කංකාරිය හා සබැඳි චාරිත්‍ර විධි

මෙහිදි පූර්ව චාරිත්‍ර සහ මඩු දින චාරිත්‍ර වශයෙන් ප්‍රජා විධි සකස් වී ඇත. එනම් කොහොඹා කංකාරිය පැවැත්වීමට පෙර දිනයන් හා ශාන්තිකමර්ය පවත් වන දින කරනු ලබන චාරිත්‍ර විධින්ය.

1. කප් සිටුවීම

කිරි ගසක අත්තක් ගොප් කොළයෙන් සරසා සුදු පිළිවටයකින් ඔතා පෙරහැරින් වඩම්මවා නියමිත ස්ථානයෙහි සිටුවීම.

2. මඩු පේ කිරීම

සරසා ගත් මඩුව සඳුන් කිරි පැන් ඉස සුවඳ දුම් අල්ලා දෙවියන් වෙනුවෙන් වෙන් කිරිම.

3. තොට පේ කිරීම

කංකාරියට අවශ්‍ය ජලය ලබා ගැනිමට සුදුසු පැන් තොටක් ගොක් රැහැන් ඇද වෙන් කිරිම.

4. මඩුව සැදීම

කප් සිටවූ ස්ථානයෙහි රියන් හැටක් දිග රියන් තිහක් පළල මඩුව සාදා තැඹිලි වලු පුවක් වලු ආදියෙන් සැරසීම.

# කොහොඹා කංකාරිය හා සබැඳි නර්තන අංග

කොහොඹා කංකාරි ශාන්තිකමර්යෙහි එන ගායන සහිත, හා ගායන රහිත නර්තන අංග මෙන්ම නාට්‍යමය පෙළපාළි දැකිය හැකිය.

## ගායනය සහිත නර්තන අංග :-

කොහොඹාහෑල්ල:- අලංකාර සාමුහික නර්තන අංගයකී.

කුවේණි අස්නේ:- නර්තන ශිල්පින්ගේ කුසලතා ප්‍රදර්ශනය කරන සාමුහික නර්තනයකි.

## ගායන රහිත නර්තන අංග :-

ආවැන්දුම:- ඉතා දීර්ඝ ශාස්ත්‍රිය නර්තන අංගයක් වන මෙය සාමුහිකව ඉදිරිපත් කෙරේ.

යක්ඇනුම :- මෙය ශාස්ත්‍රීය නර්තනකි. සියලුම නර්තන ශිල්පින් වෙස් ඇඳුම් කට්ටලයෙන් සැරසී නර්තනයට සහභාගි වේ.

## නාට්‍යමය පෙළපාළි :-

ගුරු ගේ මාලාව :- ප්‍රථම නාට්‍යමය පෙළපාලි අවස්ථාවයි.

යක්කම් පහ :- ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම, දර්ශණ යක්කම, බොරු යක්කම, සීතා යක්කම වශයෙන් යක්කම් පහකි. මේ සියල්ල නාට්‍යමය පෙළපාලි අවස්ථාවන්ය.

ගබඩා කොල්ලය :- කොහොඹා කංකාරිය සඳහා රැස් කරන ලද ද්‍රව්‍ය තබා ඇති ස්ථානය ගබඩාවයි. සංවාද සහිත නාට්‍යමය අවස්ථාවෙන් පසුව ගබඩාව ගිනි තැබූ බව සංකේතවත් කරයි.

# කොහොඹා කංකාරිය හා සබැඳි ගායනා

ශාන්තිකර්ම තුනටම පොදු වූ ගායනා ඇති අතර ඒ ඒ සම්ප්‍රදායන්ට ආවේණික වූ නාදමාලා අනුව ගායනා කරනු ලැබේ. එම ගායනා තාල තැබිය හැකි සහ තාල තැබිය නොහැකි ලෙස කොටස් දෙකකි.

- **තාල තැබිය හැකි ගායනා** (ආඝාතාත්මක)
  - කඩතුරා කවි
  - සිරසපාද කවි
  - කෝල්මුර කවි
  - උපත් කවි
- **තාල තැබිය නොහැකි ගායනා** (අනාඝාතාත්මක)
  - ශ්ලෝක
  - යාදිනි
  - නමස්කාර
  - අෂ්ඨක
  - සැහැලි

# කොහොඹා කංකාරිය හා සබැඳි වාදනය

- **වාදන අවස්ථා කිහිපයක් දක්නට ඇත.** එනම්,

මගුල් බෙර හා පිං බෙර වාදනය:

පුජාර්ථය සඳහා වාදනය කරනු ලැබේ. මෙය සාමුහික වාදනයකි.

අත්‍යාබෙර වාදනය:
ශිල්පීය දක්ෂතාව නිරූපණය කරනු ලබන ශාස්ත්‍රීය යුගල බෙර වාදන අංගයකි.

කොහොඹා කංකාරියේ සියලු බෙර වාදකයින් අයිලය ඉදිරියේ දෙපේලියක සිට වාදනය කරයි.





- ***කංකාරිය පුරාවටම ගැටබෙරය හා තාලම්පට වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගනී.***

## කොහොඹා කංකාරිය හා සබැඳි රංග සැරසිලි

සාම්ප්‍රදායන් තුනෙහිම සැරසිලි හා මෝස්තර වල ඒ ඒ ප්‍රදේශ අනුව වෙනස්කම් පවතී.

### සැරසිලි අවස්ථා

- මඩුව සැරසීම :-

  මඩුව වටා ගොක් කොළ සැරසිලි වලින් හා පස්වලු එල්ලා අලංකාර කරනු ලැබේ.

- යක්ගෙය :-

  කංකාරි මඩුවේ කෙලවර යක් ගෙය ඉදි කෙරේ. මෙය මහල් දෙකකින් යුක්තය.

- යහන :

  දෙවියන්ගේ ආභරණ, අවුපත්,ආයුධ තැන්පත් කරන්නේ යහන තුලය.



❖ *රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලි වලට අයත් වේ.*

සැරසිලි සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය

- ගොප් කොළ,
- හබරල කොළ,
- කෙසෙල් කොළ,
- පොල් මල්,
- පුවක් මල්,
- ලී කෝටු,
- පට්ටා,
- තැඹිලි වලු,
- පොල් වලු,
- දෝතලු වලු.



දිගින් හැට රියනක් හා පළලින් තිස් රියනක් වන මණ්ඩපය සරසනු ලබන්නේ ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා ගෙනය.

❖ පොදුවේ ගත් කල පරිසරයෙන් ලබා ගන්නා ලද ස්වභාවික අමුද්‍රව්‍ය පමණක් ම යොදා ගනී.